# චිත්තානන්දනීය ගී ආනන්දනී













තම පාසැල් මාතාවගේ මතු දියුණුව සහ විද්‍යාලයේ ප්‍රමුඛත්වය පවත්වාගෙන යාමට ආධාර කිරීම සඳහා නිරන්තරයෙන් යුහුසුළු වන එක්සත් රාජධානියේ ආනන්ද විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය මගින් සිංහළ අපට උරුම කලා සහ සංස්කෘතික රටාවන් ආරක්ෂා කිරීමේ හා මව්බිමෙන් ඈත්ව වෙසෙන සිංහල යන්ගේ රසාස්වාදනය උද්දීපනය කිරීමේ අභිලාෂයෙන් නොබෝදා බටහිර ලන්ඩනයේ ලෝගන් ප්‍රසංග ශාලාවේ සංවිධානය කරන ලද ගී ආනන්දනී නම් වූ සංගීත ප්‍රසංගය සෑම අංශයකින්ම සාර්ථක ඉදිරිපත්කිරීමක් හැටියට මුලින්ම සඳහන් කළ යුතුය.

කලින් පැවති ප්‍රසංගයන් මෙන් නොව මෙවර ප්‍රසංගයේ තේමාව වූයේ අවුරුදු 30 ක් මුළුල්ලේ ශ්‍රීලංකාවේ පැවති ත්‍රස්තවාදී සටන් පරදා ලක්මාතාව නිදහස්කිරීමට දිවිදුන් රණවිරුවන්ගේ පවුල් වලට මෙන්ම, යුද්ධයෙන් ආබාධිත වූ රණවිරුවන්ගේ අනාගත අභිවෘධිය සඳහා ආධාර කිරීමයි. මෙම ප්‍රසංගයෙන් ලැබෙන මුළු ආදායම අත්තිඩියේ රණ විරු අරණ පවත්වාගෙන යාම පිණිස සම්පූර්ණයෙන්ම වෙන්කෙරෙන බව ආනන්ද ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ජනක රංවාගොඩ මහතා සංගීත ප්‍රසංගය ආරම්භයේදීම කළ කෙටි හැඳින්වීමෙන් අපට පැහැදිලි විය.

ගී ආනන්දනී ප්‍රසංගය සඳහා විශේෂ ආරාධනා ලැබ මෙහි පැමිණි විශාරද නන්දා මාලිනී, වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ, දීපිකා ප්‍රිදර්ශනී හා සංගීතය මෙහෙයවූ රෝහණ වීරසිංහ යන ශිල්පීහු තමන් මෙම කර්තව්‍යයට පාත්‍රවූ චේතනාව හඳුන්වා දුන්නේ එක්තරා විධියක පුණ්‍ය කර්මයකට සහභාගිවීමක් ලෙසටය. එම පින්කමට දායකවීමට ලැබීම තම මව්බිම වෙනුවෙන් සටන් කර දිවිපිදූ, එමෙන්ම දැනට ආබාධිතව සිටින රණවිරුවන්ට කරන උපහාරයක් ලෙස සලකන බව පැවසූහ.

එදින එම වේදිකාවේ ඉදිරිපත් කළ ගී ගැයුම් පිළිබඳ තක්සේරුවක් මෙහිදී අවශ්‍ය වෙතියි මම නොසිතමි. ඒ සෑම ශිල්පියෙකුම ඉදිරිපත් කළ ගීත සමහරක් අපගේ මතකයේ තවමත් රැඳී ඇති ඒවාය. තවත් සමහරක් අප මින් පෙර නොඇසූ අළුත් ගීත විය. කෙසේ වුවද දශක තුන හතරක පමණ කාලයක් තුළ ගැයූ විවිධ ගීත ගණනාවක් නැවත ඒ ආකාරයෙන්ම ඒ හඬින්ම අසන්නට ලැබීම අපගේ භාග්‍යයක් ලෙස සලකමු. විශාරද නන්දා මාලිනී එදා ගැයූ උඩඟු ලියන්, වික්ටර් ගැයූ නන්දා මාලිනී, වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ, රෝහණ වීරසිංහ ඇතුළු ශිල්පීන්ට ලන්ඩනය ශ්‍රීලංකාව මෙන්ම ඉතා හුරුපුරුදු තවත් සංගීත මණ්ඩපයක් බව අමුතුවෙන් හැඳින්විය යුතු නොවේ. වෙනසකට ඇත්තේ දැනට මෙහි පවතින සීතල දේශගුණය පමණය. එහෙත් විටින් විට ලන්ඩනයට පැමිණි ප්‍රසංගවලට සහභාගිවී ඇති දීපිකා ප්‍රියදර්ශනීට මෙවර ප්‍රසංගය අළුත් අත්දැකීමක් විය. ඒ පළමු වතාවට එංගලන්තයේ එකම වේදිකාවක තම ගුරු මාතාව වන නන්දා මාලිනිය සමග එකම ප්‍රසංගයකට සහභාගි වන්නට ලැබීමයි.

ගී ආනන්දනී ප්‍රසංගයේ මා වඩාත් සිත්ගත් විශේෂාංගය පිළිබඳව සඳහන් නොකළහොත් එය අඩුවකැයි මට සිතේ. සුනිල් එදිරිසිංහයන් **ගම්භීර තෙදැති** නම් නූර්ති ගීතය ඉදිරිපත් කිරීමට පෙර ප්‍රේක්ෂකයන්ගෙන් ඉල්ලීමක් කළේය. එනම් තමා මෙම ගීතය ගයන බව අමතක කරන්නටය කියායි. අඩු වශයෙන් මට අත්පුඩියක්වත් ගහන්න එපා ඔහු කීවේය. ගායනය අවසානයේදීය මට දැනුණේ සංගීත ශිල්පි විජේරත්න රණතුංගයන්ට තම තාල තරංග ශිල්ප දක්වන්නට සුදුසු පිටියක් සුනිල් කාහටවත් නොදැනෙන්නට කොතරම් අගේට පිළියෙල කළාද කියා. ඇත්තටම සුනිල්ට කවුරුවත් අත්පුඩි ගැහුවේ නැත. මීට පෙර විජේරත්න රණතුංග ගැන නොදැන සිටි, ඔහු නොදැක සිටි ප්‍රේක්ෂකයින් එතැන සිටියේ නම් ඔහුගේ හැකියාව ගැන ඔවුන්ට කොතරම් පුදුම හිතෙන්නට ඇද්ද? එමොහොතේ ශාලාව දෙදරා යන තරම් නින්නාද වූ අත්පොලසන් තවමත් මට ඇසෙන්නාක් මෙනි.

රෝහණ වීරසිංහ ප්‍රමුඛ පැමිණ සිටි වාද්‍ය වෘන්දයේ වයලීන වාදක ඩී. ඩී. ගුණසේන, ගිටාර්වාදක මහින්ද බණ්ඩාර, වජිර ගෝමස් සහ ජානක බෝගොඩ යන කලාකරුවෝ අද ශ්‍රීලංකාවේ ප්‍රවීන මෙන්ම බුහුමනට පත් වාදන ශිල්පීහු වෙති. මෙම ශිල්පීන්ට පුරා හෝරා දෙක තුනක් ශ්‍රාවකයින් තම දැහැනේ බැඳ තබාගන්නට ඇති හැකියාව ගැන පුන පුනා කීම අනවශ්‍යය.

අත්‍යාලංකාරවූ එම ගී ප්‍රසංගය අවසානයේ එක් කරුණක් පිළිබඳව මගේ සිත යොමු විය. යුද්ධයක් නිසා අවුරුදු ගණනක් මුළුල්ලේ තම උපන්බිම වෙනුවෙන් දිවිදුන් ඒ විරුදරුවන් නිසා අපේ මව්බිම රැකුණි. නොඑසේ නම් අපටය කියන්නට රටක් ඒකාන්තයෙන්ම ඉතිරි නොවන්නේය. මේ ප්‍රසංගය පැවැත්වුණේ ද ඒ රණවිරුවන්ගේ අභිවෘධි සාධනය වෙනුවෙනි. එවන් අවස්ථාවක නන්දා මාලිනිය අතීතයේ ගායනා කළ අප කවුරුත් නැවත නැවතත් ශ්‍රවනය කරන්නට ආසා මේ සිංහළ අපගෙ රටයි නම් ඒ සොඳුරු ගීතය එදා ගී ආනන්දනී ප්‍රසංගයේ සිංදු ලැයිස්තුවට ඇතුළත් වුනානම් කොතරම් අගේද? අපූර්වද? යුද්ධය මෙන්ම එම ගීතයත් සිංහළයින්ට දැන් අමතක වීද? නැතිනම් එයට ඉල්ලුමක් නැතුවා වත්ද? එසේත් නැත්නම් එම ගීතය ගයන්නට කිසියම් අකමැත්තක් ගායිකාව තුළ ඇතුවා වත්ද? මා මෙන්ම මේ කරුණ බොහෝ ශ්‍රාවකයින් එදා කල්පනා කරන්නට ඇතුවා නිසැකය.

හේතුව මම් නොදනිම් !



♦ විල්ෆඩ් පෙරේරා
Berkshire UK

